# රුහුණ විශ්වවිද්‍යාලය
# UNIVERSITY OF RUHUNA

මාතර
MATARA, SRI LANKA.


2013.04.05

**අභ්‍යන්තර චක්‍රලේඛ අංක : 2013/02**

සියළුම පීඨාධිපතිවරුන්
සියළුම අධ්‍යයනාංශ ප්‍රධානීන්
පුස්තකාලයාධිකාරි

## <u>ආචාර්යවරුන් සේවයෙන් ස්ථිරව/තාවකාලිකව මුදාහැරීම සම්බන්ධ අභ්‍යන්තරික නිර්ණායක</u>

**අ. ස්ථිරව/තාවකාලිකව සේවයෙන් මුදාහැරීම**

**කොම්පනි සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක තනතුරක් දරන තැනැත්තෙකු කොම්පනි සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක හෝ වෙනත් රජයේ/සංස්ථාපිත ආයතනයක තනතුරක් භාරගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ ඉල්ලුම්පත අනුව විශ්වවිද්‍යාලය විසින් එසේ මුදා හැරීමට සලකනු ලබන්නේ පහත සඳහන් නිර්නායක අනුව වේ.**

**අ (1) ස්ථිරව සේවයෙන් මුදාහැරීම**

**අ (1.1)** ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 1.2.1 හා 1.2.2 වගන්ති අනුව කිසියම් ආචාර්යවරයකු/වරියක මුදාහැරීම රුහුණ විශ්වවිද්‍යාලයේ කාර්යයන් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන්නේ නම් ඒ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ විට අදාල අධ්‍යයනාංශ ප්‍රධාන විසින් ඉල්ලුම් පත්‍රයෙහි ඒ බව සඳහන් කළ යුතු අතර එම තත්ත්වයට බලපා ඇති හේතුන්ද සඳහන් කළ යුතුය.

**අ (1.2)** විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුට/වරියකට විශ්වවිද්‍යාලය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇති විට හෝ යම් තැනැත්තෙකු බඳවා ගැනීමේ අවස්ථාවේ දී විශේෂ සුදුසුකම් සපුරා තිබුනේ නම් හෝ එවැනි තැනැත්තෙකු එම පුහුණුවෙන්/ බඳවාගැනීමෙන් පසු වසර දහයක සක්‍රීය සේවයක් සපුරා ඇත්නම් හා අධ්‍යයනාංශයේ අනුමත ඇස්තමේන්තුවේ 80% ක් වත් ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගෙන් සම්පූර්ණ වී ඇති අවස්ථාවේ දී ඔවුන් මුදා හැරීම සලකා බැලිය හැකිය.

**අ (1.3)** ආයතන සංග්‍රහයේ **3** පරිච්ඡේදයේ 21.22 අනුව පරිවාස කාලය තුළ සිටින ආචාර්යවරයෙක්/වරියක් සේවයෙන් මුදා හැරීමට අවකාශ නොමැත.

**අ (1.4)** සේවයෙන් මුදාහැරීමක් අයදුම්කරන අවස්ථාවක ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ අවසන් නොකළ කාර්යයක නිරතව නොසිටිය යුතුය. එසේ එවැනි කාර්යයක නිරත වන්නේ නම් අදාල අධ්‍යයනාංශ ප්‍රධානගේ එකගතාවය පරිදි අදාල ආචාර්යවරයා විසින් එකී කාර්යය නිම කිරීම පිළිබඳ ලිඛිත එකගතාවයකට පත්විය යුතුය.

**අ (2) තාවකාලිකව සේවයෙන් මුදා හැරීම**

**අ (2.1)** ආයතන සංග්‍රහයේ V පරිජේදය අනුව තාවකාලික මුදාහැරීමක් සම්බන්ධ රජයේ අමාත්‍යාංශයක විධිමත් ඉල්ලීමක් ලැබුන විට එය අධ්‍යයනාංශ ප්‍රධානගේ හා පීඨාධිපතිගේ නිර්දේශ ඇතිව පාලක සභාවට ඉදිරිපත් වූ පසුව මෙම මුදාහැරීම සම්බන්ධයෙන් පාලක සභාව විසින් සලකා බලා තීරණයක් ගනු ඇත.

අ (2.2) රජයේ හෝ සංස්ථාපිත ආයතනයක සේවය සඳහා තාවකාලිකව (පූර්ණ කාලීන/ අර්ධ කාලීන) මුදා හැරීමට ඉල්ලීම් කරනු ලබන ආචාර්යවරුන්ගේ එවැනි ඉල්ලීම් රජයේ හෝ සංස්ථාපිත ආයතනය මගින් රේඛීය අමාත්‍යාංශය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත ඉදිරිපත් කර තිබීම අවශ්‍ය අතර ඒ අනුව එකී මුදාහැරීම පිළිබඳව පාලක සභාව විසින් සලකා බලනු ඇත.

අ (2.3) සේවයෙන් තාවකාලිකව මුදාහැර ඇති අවස්ථාවක වැටුප් ප්‍රතිපූර්ණයකට යටත්ව විශ්වවිද්‍යාලය විසින් පාලක සභාවේ අනුමැතිය අනුව ඔහුගේ/ ඇයගේ වැටුප් ගෙවීම සිදුකළ හැකි අතර එය ප්‍රතිපූර්ණය කිරීම ඊළග මස වැටුප් ගෙවීමට පෙර සිදුවන්නේ ද යන්න මූල්‍යාධිකාරී විසින් පරීක්ෂා කර පෞද්ගලික ලිපිගොනුවලට ද අදාල ලේඛන ඇතුළත් කිරීමට වග බලාගත යුතුය.

මෙම අභ්‍යන්තර චක්‍රලේඛ විධිවිධාන 2013.04.08 දින සිට ක්‍රියාත්මක වේ.

10/04/2013

**මහාචාර්ය ගාමිණී සේනානායක**
**උපකුලපති**

පිටපත් : නියෝජ්‍ය උපකුලපති
ලේඛකාධිකාරී
මූල්‍යාධිකාරී
සහකාර අභ්‍යන්තර විගණක
විගණන අධිකාරී/ රජයේ විගණන අංශය